# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/39 - 2017 ජුනි මස 30 වැනි සිකුරාදා - 2017.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 පෙබරවාරි මස 08 වැනි දින අංක 2005/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එහි 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජුනි මස 09 වැනි දින අංක 1448/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "ශාස්ත්‍ර පීඨය" යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන " 10. බෞද්ධ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" 11. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය".

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2017 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

07-410

1A-PG 3590 - 508 - (2017/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.